රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ: 01/2012

මගේ අංකය: PSC/EST/1/7/1/2011

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,

අංක 177, නාවල පාර

නාරාහේන්පිට,

2012 මැයි මස 31 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

<u>ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ නිලධාරීන් සඳහා සකස් කරන ලද වැඩසටහන් නිලධාරී සේවා ව්‍යවස්ථාව</u>

අංක 1745/11 හා 2012 .02.14 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද වැඩසටහන් නිලධාරි සේවා ව්‍යවස්ථාවෙහි සඳහන් විධිවිධාන වෙත ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. ඒ අනුව අදාළ සේවා ව්‍යවස්ථාවේ 14 හා 17.2 පරිච්ඡේද වල සඳහන් විධිවිධාන අනුව රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ රජයේ ප්‍රතිපත්තිය මත 1994 සිට 2011.08.11 දක්වා රජයේ සේවයට බඳවා ගත් MN-04 -2006-A වැටුප් පරිමාණය හිමි නිලධරයන් එම සේවා ව්‍යවස්ථාව ප්‍රකාශයට පත් කර මාස 05ක් ඇතුළත වැඩසටහන් නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළ කළ යුතුය. එසේ අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ නොකරන නිලධාරීන්ට ඔවුන් දැනට දරන තනතුරේ තවදුරටත් සේවය කළ හැකි අතර, ඔවුන්ට පෞද්ගලික වන සේ පමණක් එම තනතුර පැවතිය යුතුය. එවැනි තනතුරු පුරප්පාඩු වූ විට, එම තනතුරු නාම යටතේ බඳවාගැනීම් සිදු නොකරන අතර ඉදිරියේදී නව බඳවාගැනීම් සිදු කෙරෙනුයේ වැඩ සටහන් නිලධාරී සේවා ව්‍යවස්ථාව යටතේ පමණි.

03. ඉහත කරුණු සලකා බැලූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව ආශ්‍රිත නිලධාරි සේවා ගණයට අයත් බඳවා ගැනීමේ පරිපාටි සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව මතු දැක්වෙන තීරණයන්ට එළඹී බව කාරුණිකව දන්වමි.

(I) වැඩසටහන් නිලධාරී සේවා ව්‍යවස්ථාවේ 14 ඡේදය අනුව අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රියාවලිය අවසන් වන තුරු විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් ඉදිරිපත් කරන ලද ආශ්‍රිත නිලධාරී සේවා ගණය සඳහා වන බඳවාගැනීම් පරිපාටි කෙටුම්පත් අනුමත කිරීම අත්හිටුවනු ලැබේ.

(II) වැඩසටහන් නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය නොවන නිලධාරීන් සඳහා පමණක් උසස් කිරීමේ පරිපාටි අනුමත කරනු ලැබේ.

(III) අයවැය සහකාර, නීති සහකාර වැනි විශේෂිත සුදුසුකම් අවශ්‍ය වන්නාවූ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ තනතුරු වෙනුවෙන් එම සුදුසුකම් දැක්වෙන උපලේඛන සකස් කර වැඩසටහන් නිලධාරී සේවා ව්‍යවස්ථාවට ඇතුළත් කළ යුතුය. (එම තනතුරු වල පත් කිරීම් බලධරයා වනුයේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාය).

(IV) ඉහත (iii) වගන්තිය අනුව අමාත්‍යාංශ ලේකම්වරුන් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානීන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන උපලේඛන, අදාළ තනතුරු වල පත්කිරීම් බලධරයා වන ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් මඟින් ඉදිරිපත් කළ යුතුය.

(V) වැඩසටහන් නිලධාරී සේවා ව්‍යවස්ථාව අනුව අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රියාවලිය අවසන් වන තුරු දැනටමත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දී ඇති ආශ්‍රිත නිලධාරී සේවා ගණය (MN-04 -2006-A) සඳහා වන බඳවාගැනීමේ පරිපාටි ක්‍රියාත්මක කිරීම අත්හිටුවිය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ටි. එම්. එල්. සි. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව